සිළුමිණ (පෙබරවාරි 20, 2022), අරුණ (පෙබරවාරි 21, 2022), මව්බිම (පෙබරවාරි 14/20, 2022) යන පුවත්පත්වල විවිධ පුවත් වාර්තා කිරීමේදී, එම පුවතට සම්බන්ධ කාන්තාවන් "රූමතිය", "සුරූපිනිය", "සුරූපී", සහ "රූමත්" යනාදී අයුරින්, ඔවුන්ගේ බාහිර රූපය පදනම් කරගනිමින් විස්තර කර තිබුණි.

ඒ අතුරින් පුවත් වාර්තා දෙකක් දිවි තොර කරගත් බවට කියැවෙන තරුණියක් පිළිබඳව වන අතර, තවත් පුවතක වූයේ පසුගිය දිනෙක ඝාතනයට ලක් වූ කාන්තාවක් පිළිබඳවයි.

එසේ නම්,

1. දිවි අහිමි කරගැනීම්, ඝාතන වැනි සිදුවීම් දක්වන ලිපි/පුවත් වාර්තාවන් තුළ, අදාල කාන්තාවන්ගේ බාහිර රූපය ඉස්මතු කිරීම කෙතරම් එම පුවත් වලට අදාළ වන්නේ ද?

2. එසේ අදාළත්වයක් නොමැති නම්, ඒ හරහා කාන්තාවන් ඒකාකෘත කිරීමකට (stereotyping) ලක් වීමක් සිදු නොවන්නේ ද? ඒ ඔස්සේ, ඔවුන්ව කොන් කිරීමකට (discrimination) ලක් නොවන්නේද?

3. එමෙන්ම, එවැනි විස්තර කිරීම් නිසා එම පුවත් වලට භාවාතිෂය බවක් එක් නොවේ යැයි ඔබ සිතන්නේද? එවැනි භාවාතිෂය බවක් පුවත් වාර්තාවන්ට එක් වන්නේ නම්, ඒ ඔස්සේ එම පුවත් හා ඒ ඔස්සේ ආවරණය වන සමාජ ගැටළු සම්බන්ධ සියුම් තොරතුරු පාඨකයාගේ ග්‍රහණයට හසු නොවී යා හැකි යැයි ඔබ නොසිතන්නේද?

හදිසි උපකාරක අංක:
*1333-CCCline
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926

**#MediaEthicsSL #lka #Silumina #Mawbima #Aruna**